*සැ. යු.* — 2014.08.15 දින පළ වූ අංක 1,876 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,877 - 2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2014.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1038 | පළාත් පාලන සහ ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1049 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* — මහ නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (III පන්තිය) | 02 | PL-1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | *(අ)* අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 02 | සෞඛ්‍ය කම්කරු (III පන්තිය) | 03 | PL-1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | *(ආ)* අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |

03. *පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.)
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්දහිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතුය.)
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(vi) දැනටමත් ගලේවෙල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, නියමිත පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ගලේවෙල ප්‍රදේශීය සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍ර 2014 අගෝස්තු මස 31 දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ගලේවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. හැඳුනුම්පතේ පිටපතක්,
04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතුය.),
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික.

එච්. නිමල් ගුණවර්ධන,
ලේකම්,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2014 ජූලි මස 07 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
(ii) මුලකුරු සමග නම :——————————.
02. ස්ථිර ලිපිනය:——————————.
03. ග්‍රාම නිලධාරී වසම හා අංකය:——————————.
04. උපන් දිනය ඃ අවුරුද්ද:——————————, මාසය:——————————, දිනය:——————————.
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————————, මාස:——————————, දින:——————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
08. ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර:——————————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචියෙන් ද යන වග:——————————.
10. අධ්‍යාපන සුදුසුකම්:——————————.
11. වෙනත් සුදුසුකම්:——————————.
12. වෘත්තීය සුදුසුකම්:——————————.
13. සේවා පළපුරුද්ද:——————————.

(i) දැනට සේවය කරන ආයතනය:——————————.
(ii) දැනට දරන තනතුර:——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:——————————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*(දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන........................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ... ....................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්, මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
හෝ බලයලත් නිලධාරියාගේ අත්සන.

නම:——————————.
පදවි නාමය:——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව තබන්න)
දිනය :——————————.

08-673

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* | *ශිල්පීය නිපුණතා/පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික III | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (PL3-2006A) | *බාහිර අයදුම්කරුවන් සඳහා* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම් කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය. | *තනතුරේ කාර්ය භාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තිය පුහුණු ආයතනය කින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය. පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුවේ.) |
| 02 | නල ළිං පොම්ප කාර්මික III | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL2-2006A) | *බාහිර අයදුම්කරුවන් සඳහා* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම් කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය. | * තනතුරට අදාල වෘත්තිය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තිය පුහුණුව පිළිබඳ NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම * අදාල ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 03 | සෞඛ්‍ය පරිපාලක III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL1-2006A) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | - |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | ශිල්පීය නිපුණතා/පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 04 | කාර්යාල කාර්ය සහායක III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL1-2006A) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | - |
| 05 | වැඩ කම්කරු III | 03 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL1-2006A) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) | - |
| 06 | සෞඛ්‍ය කම්කරු III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL1-2006A) | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | - |

*සැ. යු.* - ඉහත තනතුරු සඳහා දැනටමත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් ගිවිසුම් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එම බඳවා ගැනීමේ දිනට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල කරගනු ලැබේ.

02. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් හා ස්ථිර අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

03. *වයස* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04. *වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 3කට නොඅඩු කාලයක් තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් සහ ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලකට දායක මුදල් ගෙවිය යුතුය.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමරතව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්පත්* .- අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2014.09.05 වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය සහ ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපත
(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිළධාරියාගෙන් විය යුතුය.)
(ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ටී. ජේ. ඊ. ප්‍රනාන්දු,
ලේකම්,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 04 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

***වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව***

***................................................... තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.

02. තැපැල් ලිපිනය:——————————.

03. උපන් දිනය ඃ අවුරුද්ද:——————————, මාසය:——————————, දිනය:——————————.

04. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————————, මාස:——————————, දින:——————————.

05. විවාහක/අවිවාහක බව. :——————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

07. ජාතිය:——————————.

08. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද යන වග:——————————.

09. අධ්‍යාපන සුදුසුකම්:——————————.

10. වෘත්තීය සුදුසුකම්:——————————.

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:——————————.

(i) දැනට දරන තනතුර:——————————.
(ii) එම තනතුරට පත්වූ දිනය:——————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම්/) පදනම මත ද?:——————————.

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:——————————.

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන........................................ මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියා

අත්සන:——————————.
නම:——————————.
පදවිය:——————————.
දිනය :——————————.

08-697

---

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | ජල කම්කරු III පන්තිය | 02 | 06/2006 IV - PL1 -2006 A රු. 11,730 - 10 x 120-10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (වෛකල්පිත විෂය හැර) |
| 2. | සෞඛ්‍ය කම්කරු | 02 | 06/2006 IV-PLI- 2006A රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600. | 08 වන ශ්‍රේණියට (නමවන වසරට) නියමිත විෂය සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 3. | රියදුරු | 01 | 06/2006 IV - PL3 2006 A රු. 12,470 - -130 x 10-145x 10 - 160 x 10 - 170 x 12 - රු.18,860 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම (වෛකල්පිත විෂය හැර) *හා* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍ර (මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුනතාවය පිළිබඳ බලපත්‍ර) (මෝටර් කෝච් -බර වාහන රියදුරු බලපත්‍රය);<br>*හෝ*<br>C - ලොරි<br>C1 - බහු කාර්ය වාහන<br>D - බස්<br>D1 - වෑන්<br>G - ට්‍රැක්ටර්<br>පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම;<br>*හා*<br>ට්‍රැක්ටර් පැදවීමේ පළපුරුද්ද පිළිබඳ සහතික ලබා ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ ; |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | හා<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.);<br>හා<br>සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.;<br>හා<br>අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතු ය. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03ක කාලයක් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අයකු විය යුතුය. (පදිංචි සහතික ඉදිරිපත් කළ යුතු ය.)
3. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය.
4. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
6. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් හා ප්‍රාදේශීය සභාව සතුවේ.
7. දැනටමත් පළාත් රාජ්‍ය සේවය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.
8. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කර ඇති සහ සේවය කරනු ලබන මූලික සුදුසුකම් සපුරාලන අය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.
9. රියදුරු තනතුර සඳහා කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියාකළ යුතුයි.
5. බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මධ්‍යම පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලටද මධ්‍යම පළාත් සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
6. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්‍ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 8.27"x11.69" (A4) පරිමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2014.09.15 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, රඹුක්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික පිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය,
2. ජාතික හැඳුනුම්පත,
3. අධ්‍යාපන සහතික,
4. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
5. වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික,
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
7. මැතක දී ලබාගත් චරිත සහතික.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2014 අගෝස්තු මස 03 වැනි දින,

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව***

............................................................................... *තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :——————————— .
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————— .

2. ස්ථිර ලිපිනය :——————————— .

3. උපන් දිනය අවුරුද්ද :——————————— , මාසය :——————————— ., දිනය:——————————— .

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවු :——————— , මාස :——————— , දින:——————— .

5. විවාහක/අවිවාහක බව :——————————— .

6. ජාතිය:——————————— .

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? :——————————— .
   එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචිවීමෙන් ද ? යන වග :——————————— .
8. අධ්‍යාපන සුදුසුකම් :
   අ.පො.ස. (සා.පෙළ) විභාගය
   සමත් වර්ෂය:——————————— . විභාග අංකය:——————————— .

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

9. (1) වෙනත් සුදුසුකම් :——————————— .
   (2) වෘත්තීය සුදුසුකම් :——————————— .
   (3) සේවා පළපුරුද්ද :——————————— .
   (4) සියළුම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය. :——————— .

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

——————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................ මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත .......................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන ස්ථිර සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක.

——————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————————.
පදවිය :——————————————.
දිනය :——————————————.

08-831

---

**සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ සීතාවකපුර නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර (12' x 8' ප්‍රමාණයේ) "ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල" යන ලිපිනයට 2014.09.12 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

| *අනු . අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | රියදුරු (II ආ පන්තිය) | 01 | රු. 12,470 - 10 x 130-10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 (PL-3 2006 A) | (i) දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පොස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්වීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්ව තිබිය යුතුය.<br>(ii) පෞද්ගලික කුලී රථ හා තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම.<br>(iii) වාහන රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්ද සහතික මගින් ඉදිරිපත් කළ යුතුය.<br>(iv) අවම උස අඩි 05ක් විය යුතුය.<br>(v) දිවා රාත්‍රී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයේ සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>(vi) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |

| අනු . අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 2. | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු (II ශ්‍රේණිය) | 03 | රු. 12,470 - 10 x 130-10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,860 (PL-3 2006 A) | (i) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේදී කුමන හෝ විෂයයන් 02ක් සමත් වී තිබීම.<br>(ii) තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32කට වඩා ගෙන යා හැකි බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම.<br>(iii) අවම උස අඩි 05යි ; අඟල් 06ක් විය යුතුය.<br>(iv) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාළ බර යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක් පළාත් රාජ්‍ය ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක් අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>(v) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය. |
| 3. | කාර්යාල සේවක සේවය (III පන්තිය) (සෞඛ්‍ය කම්කරු) | 05 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL-1-2006A) | 1. අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

03. *වයස් සීමාව.:-* ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.

*04. බඳවා ගැනීමේ ක්‍රමය.- 01.* පහත 1,11,111 හි සඳහන් සියලුම බඳවා ගැනීම් රා.ප.චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලැබේ.

(i) සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.
(ii) රියදුරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු මත බඳවා ගැනේ.
(iii) බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයක ලකුණු මත විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(iii) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
(vi) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*06. පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
(iii) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නය වූ වසර 03ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය.

*07. කොන්දේසි :*

(i) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සීතාවකපුර නගර සභාවේ ලේකම් සතුය.

*08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල සහතික කල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය :-*

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පතේ පිටපත/ගමන් බලපත්‍රයේ පිටපත,
(iii) මෑතකදී (මාස 6ක් තුළ) ලබාගත් චරිත සහතික 02ක්,
(iv) පදිංචිය සනාථ කිරීම සඳහා මෑතක දී (මාස 6 තුළදී) ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
(v) වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත (රියදුරු/බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා පමණි),

(vi) අධ්‍යාපන සහතික සහ වෘත්තීය සහතික,
(vii) පළපුරුද්ද පිළිබඳ සහතික.

එම්. එච්. ටී. ශශිකා දේවප්‍රිය,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2014 අගෝස්තු මස 07 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල***

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...................................................... තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :—————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
3. ස්ථිර ලිපිනය :—————.
4. ජාතික හැඳුනුම් පත් අංකය :—————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————, විවාහක/අවිවාහක බව :—————.
6. උපන් දිනය : 2014 .............................. දිනට වයස
   අවුරුදු:—————. මාස:—————. දින:—————.
7. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින් ද/ලියාපදිංචි වීමෙන්ද ? :—————.
8. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :

I. සමත්වූ වසර/ශ්‍රේණිය:————.

II. අ.පො.ස. (සා.පෙළ) විභාගය :-
විභාග අංකය:————. විභාග වර්ෂය හා මාසය:—————.
සමත් වූ විෂයයන්:—————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

III. අ.පොස. (උ.පෙළ) විභාගය :-
විභාග අංකය:————. විභාග වර්ෂය හා මාසය:—————.
සමත් වූ විෂයයන්:—————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

9. 1. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි.) :—————.
10. සේවා පළපුරුද්ද :—————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :—————.
12. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ......................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී ඇති /නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :—————,
පදවි නාමය:—————,
දෙපාර්තමේන්තුව/ආයතනය :—————,
(නිල මුද්‍රාව යොදන්න)
දිනය:—————.

08-812

---

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2014.04.01 දින අංක 6 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

2014.06.06 වැනි දින අංක 1866 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ පරිදි එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව විරෝධතාවයක් නොමැති හෙයින් එම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල මහ නගර සභාව.

2014 ජූලි මස 22 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම්පස වරිපනම් අංක* | *දකුණුපස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 1 | මැදපතන ගල්වල පාර | මැදපතන වටරවුම් පාර | ගල්වල | 87/2,87/3,87/5 | 87/14,87/16,87/08,87/10 87/8ජී | 250 | 4.5 |

08-710

---

## මහරගම නගර සභාව

නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,<br>
සභාපති,<br>
මහරගම,<br>
නගර සභාව.

2014 ජූලි මස 30 වැනි දින.

### උපලේඛනය

| | | |
|---|---|---|
| පාරේ නම | : | රුක්මලේ බාලිකා නිවාස පාරට මුහුණලා පිහිටි වරිපනම් අංක 192/3 සිට 192/1 යන නිවාස පිහිටි මාර්ගය |
| දිග | : | අඩි 540 |
| පළල | : | අඩි 11ත් 13ත් අතර |
| ආරම්භය | : | ව.අ. 194 |
| අවසානය | : | ව. අ. 192/7 |
| පාරේ නම නිවාස 159/1 | : | මහරගම පන්සල පාරේ, "ගමඉමවත්ත", නැමති සංකීර්ණයට ප්‍රවේශ වන මාර්ගය (අංක 159 සිට දරන නිවාස පිහිටි) මාර්ගය |
| දිග | : | අඩි 412 |
| පළල | : | අඩි 20 |
| ආරම්භය | : | ව.අ. 159 |
| අවසානය | : | ව. අ. 159/G |
| පාරේ නම | : | මහරගම නාවින්න, පරණ කොට්ටාව පාර, අංක 89/1 සිට 89/2 දරන නිවාස පිහිටි අතුරු මාර්ගය |
| දිග | : | අඩි 430 |
| පළල | : | අඩි 10 |
| ආරම්භය | : | ව.අ. 89 |
| අවසානය | : | ව. අ. 89/14 |

| වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් |
|---|---|
| 01. ශිලා වඩුගේ මිය | 01. ඩී. ඒ. කොතලාවල මයා |
| 02. ඊ.ඩී. ලලිතා ද අල්විස් මිය | 02. බී. ඒ. ධර්මදාස මයා |
| 03. ධර්මා කරුණාරත්න මයා | 03. හේමන්ත බටගොඩ මයා |
| 04. ඊ. ඩී. චමින්ද අල්විස් මයා | 04. වසන්තා බටගොඩ මයා |
| | 05. බන්දු සිල්වා මයා |
| | 06. ඒ. ඊ. ඒ. හේමපාල ද අල්විස් මයා |

08-672

---

## බලන්ගොඩ නගර සභාව

### "සිසිල ඉන් " නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදීමට පෙර කරනු ලබන විරෝධතා කැඳවීම

පන්නිපිටිය හයිලෙවල් පාරේ, අංක 152 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 663541544V දරන දළුගොඩ ලියනගේ රංජිත් ලියනගේ යන අයට අයත් බළන්ගොඩ, තුඹගොඩ, වෙට්නෝල් පාර, අංක 67/7 දරන ස්ථානයේ දඹුල්ල, කල්කිරියාගම පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 870813097V දරන හේරත් මුදියන්සේලාගේ නන්දික දූෂාන්ත හේරත් යන අය විසින් "සිසිල ඉන් "නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා බලන්ගොඩ නගර සභාවෙන් අවසර ඉල්ලා ඇත.

02. මේ සම්බන්ධව 2014.07.31 දින පැවති මහ සභාවේ යෝජනා අංක 06:15 මගින් මෙම නිවාඩු නිකේතනය පිළිබඳ අවට පදිංචි ජනතාවගෙන් සිවිල් සංවිධානවලින් හා පුද්ගලයින්ගෙන් විරෝධතා කැඳවන ලෙස මහ සභාව විසින් මා වෙත නියම කර ඇත.

03. ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය වූ 1987 අංක 18 දරන පනතින් අවසන්වරට සංශෝධිත 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 157(ඊ) වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල අනුව සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1808 සහ 2013.04.26 දිනැති ගැසට් පත්‍රය මගින් වැළඳගෙන ඇති 1956 ජූනි මස 08 වැනි දින අංක 10939 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ගැසට් පත්‍රයේ viii කාණ්ඩයේ ලැගුම්හල් පිළිබඳ උපනීති 1(1), 2(අ) වන වගන්ති ප්‍රකාරව මෙම ලැගුම්හල සඳහා අවසර දීම සලකා බැලීමට පෙර විරෝධතා මෙම නිවේදනය පළවී දින 14ක් ඇතුළත සභාපති, බලන්ගොඩ නගර සභාව ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වනු ලැබේ.

04. යම් විරෝධතාවයක් ලැබුණහොත් එය ලැබී සති දෙකක් තුල විමර්ශනයට කටයුතු කරන අතර, එසේ විරෝධතා නොලැබුණහොත් අනෙකුත් අතුරු ව්‍යවස්ථා කොන්දේසි සපුරා තිබේ නම්, මෙම ස්ථානය සඳහා වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,<br>
සභාපති,<br>
බලන්ගොඩ නගර සභාව.

08-828

---

### සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම

1953 නොවැම්බර් මස 06 වන දින අංක 10609 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ පළමුවන(I) කොටසේ සිට විසි අටවන කොටස (XXVIII) දක්වා ඇති අතුරු ව්‍යවස්ථාවන් පිළිගෙන හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 2013 සැප්තැම්බර් මස 26 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 05.03 යටතේ තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

වෛද්‍ය අලගමුත්තු නන්දකුමාර්,<br>
සභාපති,<br>
හැටන් දික්ඔය නගර සභාව.

2014 ජූලි මස 30 වැනි දින,<br>
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

08-674

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.